SRI LANKA

## ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# AA1 විභාගය - 2019 ජනවාරි

# ප්‍රශ්න සහ යෝජිත උත්තර
# විෂය අංක (AA13)

## ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව (EBA)

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**
අංක 540, පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නාහිමි මාවත,
නාරාහේන්පිට, කොළඹ 05.

දුරකථන : 011-2-559 669

මෙය අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශයේ ප්‍රකාශනයකි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

අධ්‍යාපන හා පුහුණු කිරීම් අංශය

## AA1 විභාගය - 2019 ජනවාරි
## (AA13) ව්‍යාපාර සහ ගිණුම්කරණය සඳහා ආර්ථික විද්‍යාව

## යෝජිත උත්තර

**A කොටස**

**වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)**

**අනිවාර්ය ප්‍රශ්න විස්ස (20) කි.**

**(මුළු ලකුණු 40)**

### 01 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

| ප්‍රශ්න අංකය | උත්තරය |
|---|---|
| 1.1 | 4 |
| 1.2 | 2 |
| 1.3 | 4 |
| 1.4 | 4 |
| 1.5 | 2 |
| 1.6 | 3 |
| 1.7 | 4 |
| 1.8 | 1 |
| 1.9 | 4 |
| 1.10 | 1 |
| 1.11 | අසත්‍යයි. |
| 1.12 | සත්‍යයි. |
| 1.13 | අසත්‍යයි. |
| 1.14 | සත්‍යයි. |
| 1.15 | සත්‍යයි. |
| 1.16 | මිශ්‍ර ආර්ථිකය |
| 1.17 | ඒකාධිකාරී තරගය |
| 1.18 | පොදු භාණ්ඩ |
| 1.19 | පාවෙන |
| 1.20 | මූල්‍ය අතරමැදිකරණය |

*(එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)*

***A* කොටසෙහි අවසානය.**

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න හතරකි. (04)

(මුළු ලකුණු 40)

## 02 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

පරිච්ඡේදය 02 - පාරිභෝගික හැසිරීම සහ වෙළෙඳපොළ

(a)

i.

Qd = 200 - 2p

Qs = -40 + 6p

**සමතුලිතයේ දී Qd = Qs** වේ.

200 - 2p = -40 + 6p

240 = 8p

240/8 = p

30 = P

**සමතුලිත මිල = රු. 30/-**

ii.

P = Qd සමීකරණයට 30 ආදේශ කිරීමෙන්

Qd = 200 - 2p

Qd = 200 - (2 x 30)

Qd = 200 - 60


Qd = 140

**සමතුලිත ප්‍රමාණය = ඒකක 140**

iii.

පාරිභෝගිකයාගේ රුචිය අඩුවන විට භාණ්ඩය සඳහා ඇති ඉල්ලුම අඩු වේ. මේ නිසා ඉල්ලුම් වක්‍රය වමට විතැන් වේ.

මේ නිසා සමතුලිත මිල සහ ප්‍රමාණය පහත ආකාරයෙන් අඩු වේ.




(ලකුණු 03)

(b) **මිල ඉල්ලුම් නම්‍යතාව පහත සාධක මත තීරණය වේ.**

- සලකා බලන භාණ්ඩය සඳහා පවතින ආදේශන භාණ්ඩවල සුලබතාවය.
- සලකා බලන භාණ්ඩයේ ස්වභාවය (එම භාණ්ඩය අත්‍යවශ්‍ය භාණ්ඩයක් ද නැතහොත් සුඛෝපභෝගී භාණ්ඩයක් ද යන බව)
- පාරිභෝගිකයාගේ අයවැයෙහි වෙන්වී ඇති ප්‍රමාණය (කිසියම් භාණ්ඩයක් සඳහා පාරිභෝගිකයා තම ආදායමෙන් වැය කරන ප්‍රතිශතය)
- ගතවන කාලය (කාල සාධක)
- භාණ්ඩය භාවිත කිරීමේ පුරුද්ද
- අවශ්‍යතා හෝ භාවිත ගණන
- භාණ්ඩයක අර්ථ දැක්වීම
- විකල්ප භාවිතයන්

(ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

**පරිච්ඡේදය 03 - නිෂ්පාදනය හා පිරිවැය**

(a) වසා දැමීමේ නිෂ්පාදන මට්ටම යනු, ව්‍යාපාර ආයතනයක් කර්මාන්තයෙන් පිටවී යාමේ නිෂ්පාදන මට්ටම හෝ ව්‍යාපාර ආයතනයක් එහි ව්‍යාපාර කටයුතු වසා දමන නිෂ්පාදන මට්ටමයි. මෙම නිෂ්පාදන මට්ටමේ දී පහත කොන්දේසි සම්පූර්ණ විය යුතුය. මෙම නිෂ්පාදන මට්ටම භාණ්ඩයේ අවම මිල තීරණය කිරීමට උපකාරී වේ.

**සාමාන්‍ය විචල්‍ය පිරිවැය = මිල (සාමාන්‍ය ආදායම)**


ව්‍යාපාරයක් ලාභ හෝ පාඩු නොලබන මුළු පිරිවැය, මුළු ආදායමට සමාන වන නිෂ්පාදන මට්ටම ලාභ සමච්ඡේදන නිෂ්පාදන මට්ටමයි. මෙම නිෂ්පාදන මට්ටමේදී ආයතනයකට එහි මුළු පිරිවැය ආවරණය කරගැනීමට හැකි වේ.

**මුළු ආදායම (TR) = මුළු පිරිවැය (TC)**

**සාමාන්‍ය ආදායම (AR) = සාමාන්‍ය පිරිවැය (AC)**

**සාමාන්‍ය මුළු පිරිවැය = මිල**

සාමාන්‍ය මිල (AR) = සාමාන්‍ය පිරිවැය (AC)




**(ලකුණු 06)**

(b)

| පරිච්ඡේදය 06 - බැංකු හා මූල්‍ය ප්‍රතිපත්තිය |
|---|

i. වාණිජ බැංකුවල කාර්යයන් පහත පරිදි දැක්විය හැකිය.

- ඉතිරි කිරීම් හා ජංගම ගිණුම් වැනි මහජනතාවගෙන් තැන්පතු භාරගැනීම.
- ණය සහ අයිරා ආකාරයෙන් මුදල් ණයට දීම.
- බැංකු, පුද්ගලයන්ට, සමාගම්වලට හා ආණ්ඩුවට එකිනෙකා වෙත ගෙවීම් කළ හැකි යාන්ත්‍රණයක් සපයයි.
- පුද්ගලයන්ට, සමාගම්වලට හා ආණ්ඩුවට ඔවුන්ගේ ධනය ගබඩා කිරීමට තැනක් ලබාදීම.
- පුද්ගලයන්ට, සමාගම් හා ඔවුන්ගේ වටිනාකම් ගබඩා කිරීම සඳහා සුරක්ෂිත ගබඩා සැපයීම.
- ආයෝජන සම්බන්ධ කාරණාවල දී පුද්ගලයින් සහ සමාගම්වලට උපදෙස් දීම හා සහාය දීම.
- මෙහෙයුම් ලිපි ලේඛන මගින් අපනයනකරුවන් හා ආනයනකරුවන්ට සහාය ලබාදීම.
- විදේශ මුදල් ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම.
- ණය සාධකකරණ සේවා.

**(ලකුණු 03)**

ii. ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා නිදසුන් පහත වේ.

- ලංකා බැංකුව
- මහජන බැංකුව
- කොමර්ෂල් බැංකුව
- හැටන් නැෂනල් බැංකුව
- සම්පත් බැංකුව
- නේෂන්ස් ට්‍රස්ට් බැංකුව
- සෙලාන් බැංකුව
- පෑන් ඒෂියා බැංකුව
- NDB බැංකුව
- HSBC බැංකුව
- ස්ටෑන්ඩර්ඩ් චාටඩ් බැංකුව

**(ලකුණු 01)**


**(මුළු ලකුණු 10)**

## 04 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

පරිච්ඡේදය 05 - මුදල් හා මිල මට්ටම

**(a)** මුදල් සඳහා ඇති ඉල්ලුම යනු මිනිසුන්ට මුදල්, මුදල් ආකාරයෙන් තබා ගැනීමට ඇති කැමැත්තයි. මුදල් සඳහා ඇති මුළු ඉල්ලුම ජාතික ආදායම, පොලී අනුපාතික හා මිල මට්ටම් යන විවිධ සාධක මත තීරණය වේ. ආර්ථිකයේ පොලී අනුපාතය තීරණය කිරීමේ බලවේග දෙකෙන් එකක් ලෙස මුදල් සඳහා ඇති ඉල්ලුම දැක්විය හැකිය.

ආර්ථිකයේ ජාතික ආදායම වැඩිවීම වැනි විවිධ හේතු නිසා මුදල් සඳහා ඇති ඉල්ලුම වැඩිවන විට, ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වී, පොලී අනුපාතය වැඩි වන අතර මුදල් සැපයුම නොවෙනස්ව පවතී. අනෙකුත් සාධක ස්ථාවරව පවතින විට මුදල් සඳහා ඇති ඉල්ලුම අඩුවන විට පොලී අනුපාතය ද අඩු වේ.




***(ලකුණු 06)***

(b)

ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය යනු, දෙන ලද කාලසීමාවක දී භාණ්ඩ හා සේවා සඳහා ඇති ඉල්ලුම වැඩිවීම නිසා සාමාන්‍ය මිල මට්ටම ඉහළ යාමයි. ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනයට හේතු වන්නේ මුදල් සැපයුමේ වැඩිවීමත්, පෞද්ගලික හා රාජ්‍ය වියදම වැඩිවීමත්, ආර්ථිකයේ අපනයන ආදායම වැඩිවීමත් යනාදියයි.

ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය ඇති වන්නේ භාණ්ඩ හා සේවා සඳහා ඇති මුළු ඉල්ලුම මුළු සැපයුම අභිබවා යන විටදී ය. මෙම ආකාරයේ උද්ධමනයක් ඇති වන්නේ සමස්ත ඉල්ලුමේ අතිරික්ත වර්ධනයක් හා උද්ධමන පරතරයක් ඇති විට දී ය.


පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමනය ඇතිවන්නේ නිෂ්පාදන පිරිවැය වැඩි වන විට ලාභ අනුපාතිකය පවත්වා ගැනීමට හෝ ආරක්ෂා කිරීමට මිල ගණන් වැඩි කරන විටදී වන අතර නිෂ්පාදන පිරිවැය වැඩි කිරීමට මෙය හේතු වේ.


පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමනය සැපයුමෙන් ඇරඹෙන අතර, දෙන ලද කාලයක නිෂ්පාදන පිරිවැය වැඩිවීම හා මුළු සැපයුම අඩු වීම සිදුවන හෙයින් ආර්ථිකයේ මිල මට්ටම ඉහළ යාමකි.

පිරිවැයෙන් තල්ලුවුණු උද්ධමනය ඇතිවීමට බලපාන ඇතැම් හේතූන් නම්,

- ආර්ථිකයේ වැටුප් අනුපාතය වැඩිවීම.

- ආර්ථිකයේ පොලී අනුපාත වැඩිවීම.
- අමුද්‍රව්‍යවල මිල හා අනෙතුත් යෙදවුම්වල මිල වැඩිවීම.
- ආනයන මිල ඉහළ යාම.




***(ලකුණු 04)***

***(මුළු ලකුණු 10)***

## 05 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

(a)

| පරිච්ඡේදය 05 - මුදල් හා මිල මට්ටම |
|---|

විවෘත වෙළෙඳපොළ කටයුතු යනු, මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් විවෘත වෙළෙඳපොළෙන් මිලට ගැනීම හා විකිණීමයි.

මුදල් සැපයුම අඩු කිරීමට අවශ්‍ය නම්, විවෘත වෙළෙඳපොළේ භාණ්ඩාගාර බිල්පත් විකුණනු ලැබේ.

මිලදී ගන්නන් මෙම සුරැකුම්වලට ගෙවන්නේ වාණිජ බැංකුවල ඇති ඔවුන්ගේ ජංගම ගිණුම්වලින් ලබාගන්නා චෙක්පත්වලිනි. මේ හරහා වාණිජ බැංකුවලට ණයදීමට ඇති හැකියාව අඩු වේ.

අනෙක් අතට, මුදල් සැපයුම වැඩි කිරීමට අවශ්‍ය වූ විට මහ බැංකුව සුරැකුම් නැවත මිලට ගන්නා අතර, මෙවිට මහ බැංකුවෙන් මහජනයාට මුදල් ගලා එන අතර, මුදල් සැපයුමේ වැඩිවීමක් ද දැකගත හැකිය.

***(ලකුණු 04)***

(b)

| |
|---|
| **පරිච්ඡේදය 08 - අන්තර්ජාතික වෙළෙඳාම** |

**ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග වල අවාසි:**

- අන්තර්ජාතික වෙළෙඳාමෙන් ලබාගත හැකි පූර්ණ ප්‍රතිලාභ ලබා ගැනීමට නොහැකිවීම.
- තරගකාරිත්වය අඩුවූ විට නිපදවන භාණ්ඩවල ගුණත්වය පහල යාම.
- ආරක්ෂණවාදි ක්‍රියාමාර්ග නිසා විදේශයන්ගෙන් ගෙන්වන භාණ්ඩ හා සේවාවල පිරිවැය ඉහල යාම.
- අපනයන හා ආනයනවලට බාධා පැනවීම නිසා රටක ජීවන තත්ත්වය පහළ බැසීම.
- සුබසාධන වාසි කැප කිරීම.
- කිසියම් රටකින් කරන ආනයන සිමාකළ විට එම රටද එදිරිවාදි ක්‍රියාමාර්ග ගැනිමට පෙළඹිය හැකි විම.
- විදේශ තරගකාරිත්වය නොමැති විට දේශීය කර්මාන්ත අකාර්යක්ෂම විය හැකි විම.
- නිදහස් වෙළෙඳාම දේශීය ආයතන වැඩි විදේශීය තරගයකට මුහුණපාන නිසා, ගුණත්වයෙන් වැඩි භාණ්ඩ සේවා නිෂ්පාදනයට බලපෑම් කරයි. ජීවන වියදම ඉහළ යයි.
- නිදහස් වෙළෙඳාම අපනයන හා ආනයන කිරීමට සමාගම් උනන්දු කරයි. මෙය පාරිභෝගිකයන්ට වැඩි තෝරාගැනීමක් කිරීම දිරිමත් කළ යුතු අතර එය ජීවන වියදම ඉහළ යාමට බලපානු ඇත.

***(ලකුණු 02)***

(c)

| |
|---|
| **පරිච්ඡේදය 08 - අන්තර්ජාතික වෙළෙඳාම** |

- රට තුළට ආනයන වැඩිවීම.
  කාලපරිච්ඡේදය තුළ රටට ආනයනය කරනු ලබන සියලු ආකාරයේ භාණ්ඩ ආනයනය වැඩි වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස විදේශ විනිමය සඳහා ඉල්ලුම වැඩි වී ඇත.
- රටෙන් විදේශ ආයෝජන ඉවත් වී රට තුළට අඩු ආයෝජන ලැබීම.
  දේශපාලනික හා ආර්ථික හේතු මත බොහෝ විදේශීය ආයෝජකයින් රට අතහැර යාම සහ එහි ප්‍රතිඵලයක් ලෙස අපේ මුදල් අවප්‍රමාණය වේ.
- අපනයනවල අඩු වර්ධනය. අපනයන ආදායම අඩුවන විට විදේශ මුදල් සැපයුම අඩු වී මුදල් අවප්‍රමාණය වේ.
- පහළ මට්ටමේ විදේශ සංචිත සහ ඉහළ ණය හා ණය පියවීම්.

***(ලකුණු 06)***

***(මුළු ලකුණු 10)***

***B* කොටසෙහි අවසානය.**

**C කොටස**

අනිවාර්ය ප්‍රශ්නයකි.

(මුළු ලකුණු 20)

## 06 වන ප්‍රශ්නය සඳහා යෝජිත උත්තර

A)

**පරිච්ඡේදය 04 - වෙළෙඳපොළ ක්‍රමය තුළ රජයේ කාර්යභාරය**

(a)

**රාජ්‍ය ව්‍යවසාය ක්‍රමයේ වාසිඃ**

- රාජ්‍ය ව්‍යවසායේ ප්‍රධාන අරමුණ ලාභ ඉපයීම නොව, සේවා සැපයීම වන නිසා සමාජ සුබසාධනය ඇති කිරීමට එය හේතු වේ.
- රාජ්‍ය ව්‍යවසායකින් ලාභ ලැබුවද, එම ලාභය පෞද්ගලික අයෙකුට නොයන නිසා රාජ්‍ය ආදායමට එකතු වේ. පොදුවේ මහජන සුභසාධනය දියුණු කිරීමට මෙම ලාභය යොදා ගත හැකිය.
- රජයට මහා පරිමාණ යෝජනා ක්‍රම ඇරඹීමේ හැකියාව ඇත.
- රාජ්‍ය ව්‍යාපාරිකයන්ට දක්ෂතම ශ්‍රමිකයන් ලබාගැනීමට හැකියාව ඇත. මේ නිසා කාර්යක්ෂමතාව පුළුල් කරගත හැකිය.
- රජයේ වගකීම යටතේ නිපදවන හෙයින් පාරිභෝගිකයන්ට සිදුවන අසාධාරණයන් අඩු කළ හැකිය.
- රැකියා සුරක්ෂිතභාවය සහතික වීම.

***(ලකුණු 02)***

(b) **රාජ්‍ය අයවැයක ප්‍රධාන අරමුණු පහත පරිදි දැක්විය හැකිය.**

- හිඟ සම්පත් සාධාරණ ලෙස බෙදා හැරීම.
- ආදායම් ප්‍රතිව්‍යාප්තියක් ඇති කිරීම.
- ආර්ථික වර්ධනයට හා සංවර්ධනයට අවශ්‍ය කටයුතු සැලසීම.
- ආර්ථික ස්ථායීතාව ආරක්ෂා කරගැනීම.
- ආර්ථික ස්ථායිතාවය පවත්වාගෙන යාම.

***(ලකුණු 04)***

B.

**පරිච්ඡේදය 07 - සාර්ව ආර්ථිකය සහ ව්‍යාපාර පරිසරය**

(a)

**මූලික මිල අනුව දළ (සමස්ත) එකතු කළ අගය**

| | *(රු. මිලියන)* |
|---|---|
| සේවක ආදායම | 2,000 |
| ශුද්ධ මෙහෙයුම් අතිරික්තය | 1,000 |
| මිශ්‍ර ආදායම | 1,100 |
| නිෂ්පාදන හා ආනයන මත ශුද්ධ බදු | 750 |
| **මූලික මිල අනුව දළ (සමස්ත) එකතු කළ අගය** | **4,850** |

(b) **වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය**

| | |
|---|---|
| මූලික මිලට අනුව දළ (සමස්ත) එකතු කළ අගය | 4,850 |
| ශුද්ධ වක්‍ර බදු | 150 |
| **වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය** | **5,000** |

(c) **දළ ජාතික ආදායම (GNI)**

| | |
|---|---|
| වෙළෙඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය | 5,000 |
| විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම | 1,200 |
| **දළ ජාතික ආදායම (GNI)** | **6,200** |

(d) **වැය කළ හැකි දළ ජාතික ආදායම**

| | |
|---|---|
| දළ ජාතික ආදායම | 6,200 |
| විදේශිය ශුද්ධ වර්තන (ජංගම සංක්‍රාම) | 550 |
| **වැය කළ හැකි දළ ජාතික ආදායම** | **6,750** |

***(ලකුණු 10)***

(C)

**පරිච්ඡේදය 09 - ආර්ථික වර්ධනය හා සංවර්ධනය**

(a) **ආර්ථික වර්ධනය**

ආර්ථික වර්ධනය යනුවෙන් අදහස් කරනුයේ රටක නිෂ්පාදන ධාරිතාව හෙවත් නිෂ්පාදන හැකියාවේ ඉහළ යාමකි. එනම්, රටක මූර්ත නිෂ්පාදනයෙහි ඉහළ යාමකි. ආර්ථික වර්ධනය නිසා නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය දකුණට විතැන් වේ.

පහත සාධක ආර්ථිකයේ ආර්ථික වර්ධනයට දායක වේ. (ඕනෑම සාධක 04ක්)

- සම්පත් උරුමය වැඩි කිරීම.
- ඵලදායිතාවය වැඩි කිරීම.
- සාර්ව ආර්ථික ස්ථාවරත්වය (උද්ධමනය පාලනය කිරීම).
- ආර්ථිකය තුළ හිතකර දිරිගැන්වීමක් ඇත.
- ව්‍යවසායකයින්ගේ කුසලතා සංවර්ධනය.
- යහපාලනය.
- දේශපාලනික ස්ථාවරත්වය.

(b) **ආර්ථික සංවර්ධනය**

ආර්ථික සංවර්ධන යනු, කාලයත් සමග ආර්ථිකයේ නිෂ්පාදනවල ප්‍රමාණාත්මක හා ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමේ ක්‍රියාවලියයි. ආර්ථික වර්ධන සංවර්ධන ක්‍රියාවලියේ අවශ්‍යතාවයක් පමණක් නොව, සමාජ, සංස්කෘතික හා ව්‍යුහාත්මක වෙනස්කම්වල දියුණුවක් ද අවශ්‍ය වේ.

***(ලකුණු 04)***

***(මුළු ලකුණු 20)***

**C කොටසෙහි අවසානය.**

***Notice :***

These answers complied and issued by the Education and Training Division of AAT Sri Lanka constitute part and parcel of study material for AAT students.

These should be understood as Suggested Answers to question set at AAT Examinations and should not be construed as the "Only" answers, or, for that matter even as "Model Answers".

The fundamental objective of this publication is to add completeness to its series of study texts, designs especially for the benefit of those students who are engaged in self-studies. These are intended to assist them with the exploration of the relevant subject matter and further enhance their understanding as well as stay relevant in the art of answering questions at examination level.

*© 2019 by the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*
*All rights reserved. No part of this document may be reproduced or transmitted in any form or by any means, electronic, mechanical, photocopying, recording or otherwise without prior written permission of the Association of Accounting Technicians of Sri Lanka (AAT Sri Lanka)*